# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය**

# පුරප්පාඩු

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), අපනයන ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම සඳහා වූ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වේ.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි උපාය මාර්ග සැලැස්මේ සඳහන්ව ඇති අපනයන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා දායකත්වය සැපයිය හැකි සහාථ වූ හැකියාවන්ගෙන් හෙබි අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් වලින් යුත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. සංඛ්‍යාලේඛන නිලධාරී (JM 1-1)

**සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක්, (සංඛ්‍යානය සහිතව නම් වඩා යෝග්‍ය වේ.)

1 වන හෝ දෙවන පංතියේ උපාධියක් හිමි අයහට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

පරිගණකගත දත්ත විශ්ලේෂණය පිළිබඳ දැනුම වාසිදායක වනු ඇත.

**වැටුප් පරිමාණය** (JM 1-1)

රු. 42,600/-x10x755-18x1,135=70,580/-, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ (DMS) අංක 2/2016 දරණ චක්‍රලේඛයේ ඇමුණුම II හි සඳහන් උපදෙස් වලට අනුකූලව වැටුප් ගෙවනු ලැබේ.

## 02. තාක්ෂණික සහකාර (MA 2-1)

**සුදුසුකම් :**

NDT හෝ පිළිගත් ආයතනයක් මගින් පවත්වනු ලබන පරිගණක ආශ්‍රිත NVQ 5 මට්ටමට නොඅඩු තාක්ෂණික සුදුසුකමක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :** (MA 2-1)

රු. 30,310/- - 10x300 - 7x350 - 4x495 - 20x660 = 50,940/- කළමනාකරණ දෙපාර්තමේන්තුවේ (DMS) අංක 2/2016 දරන චක්‍රලේඛයේ ඇමුණුම II හි සඳහන් උපදෙස් වලට අනුකූලව වැටුප් ගෙවනු ලැබේ.

### රැකියා විස්තර :

රැකියා පිළිබඳ විස්තර හා වැඩිදුර තොරතුරු සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) හි, වෙබ් අඩවිය වන. www.srilankabusiness.com වෙත පිවිසෙන්න.

### වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුයි. කෙසේ වෙතත් මෙම උපරිම වයස් සීමාව, රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් හට හා අභ්‍යන්තර අයදුම්කරුවන් හට බල නොපානු ඇත.

### තෝරා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරඟකාරී පරීක්ෂණයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලැබෙන ප්‍රතිඵල මත.

### වෙනත් ප්‍රතිලාභ :

- පවුලේ සාමාජිකයන්ද ආවරණය වන පරිදි වෛද්‍ය ප්‍රතිකාර සඳහා වියදම් ප්‍රතිපූර්ණය කිරීම
- රජයේ අනුමත සහන පොලී ප්‍රමාණයන් යටතේ ආපදා ණය
- රජයේ අනුමත සහන පොලී ප්‍රමාණයන් යටතේ නිවාස ණය
- වාර්ෂික ප්‍රසාද දීමනා සහ ලබා නොගත් වෛද්‍ය නිවාඩු මූල්‍යකරණය
- තෝරාගත් මාර්ග සඳහා බස්රථ පහසුකම්
- EPF - සේවකයාගෙන් -10% ආයතනයෙන් - 15% සහ ETF - ආයතනයෙන් 3%

### අයදුම්කිරීමේ පිළිවෙළ

අදාළ අයදුම්පත්‍ර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 05 වන මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ අංශයෙන් හෝ www.srilankabusiness.com වෙබ් අඩවියෙන් ("Announcements" කාණ්ඩය යටතේ) ලබාගත හැක. සම්පූර්ණ ජීවන දත්ත සඳහන් අයදුම්පත් එක් එක් තනතුර සඳහා වෙන් වෙන්ව අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් සමග 02/02/2017 වැනි දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට සභාපතිනිය සහ ප්‍රධාන විධායක වෙතට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තනතුරු නාමය සඳහන් කළ යුතුය.

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු අතර, එම අයදුම්පතේ අමතර පිටපතක් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර මණ්ඩලය වෙත එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

**සභාපතිනිය සහ ප්‍රධාන විධායක**

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**

**NDB - EDB ගොඩනැගිල්ල,**

**අංක 42, නවම් මාවත, කොළඹ 02.**

**දුරකථන : 011-2300700, ෆැක්ස් : 011-2300715**

**www.srilankabusiness.com**